කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams — රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. AAIB/8/G/00771

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.

දිනය / திகதி / Date 2024.12.29

# මාධ්‍ය නිවේදනය

## 2024 යල කන්නයට අදාල සියලු වන්දි මුදල් ගෙවා අවසන් කරයි.

2024 යල කන්නයට අදාලව ගංවතුර, නියඟ සහ වල් අලි උවදුරු මඟින් සිදු වූ වගා හානි වලට අදාල සියලු වන්දි ලබන ජනවාරි 05 වන දිනට පෙර ගෙවා අවසන් කිරීමට කටයුතු යොදා ඇත.

මෙහිදී 2024 මාර්තු මස සිට ඔක්තෝම්බර් කාලය දක්වාම යල කන්නයට අදාලව විවිධ හේතූන් මත, වී වගාව ඇතුළු අනෙකුත් වගාවන් විනාශ වීමට ලක් විය. විශේෂයෙන්ම නියඟ, ගංවතුර ආදී තත්ත්වයන් සහ වල් අලි හානි විශේෂ විය.

ජනවාරි 05 වන විටදී සියලුම දිස්ත්‍රික්ක වලට වගා හානි ගෙවීමට කටයුතු යොදා ඇත. මේ වන විට 80% කට ආසන්න ගොවීන් ප්‍රමාණයකට රුපියල් මිලියන 80 කට ආසන්න මුදලක් ගෙවීමට හැකියාව ලැබී ඇත. ඉතිරි ගොවීන් සියලු දෙනාටම ජනවාරි 05 දින වන විටදී අදාල වන්දි මුදලින් ගෙවීමට කටයුතු කර ඇත. මෙහිදී එම වන්දි මුදල සෘජුවම ගොවියාගේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු යොදා ඇත.මෙහිදී වන්දි මුදල් ඉතාම ප්‍රවේසම් සහිතව හා විනිවිදව ගෙවීමට කටයුතු සලසා ඇත.

2024/ 2025 මහ කන්නයට අදාල වන්දි මුදල් පෙබරවාරි මාසයේ මුල වන විට ගෙවීමට කටයුතු යොදා ඇත.

පේමසිරි ජාසිං ආරච්චි
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

දුරකථන / தொலைபேசி / Telephones
ෆැක්ස් / பெக்ஸ் / Fax

සභාපති / தலைவர் / Chairman
011-3484860
011-2812573
e-mail: chairman@aib.gov.lk

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம / Director General
011-3484863
011-2812574
e-mail: dg@aib.gov.lk

ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office
011-2384000